# You Can Stop Crying Now Mother !



*That happy news of war victory in Sri Lanka was acknowledged by the whole nation as well as the Sri Lankana patriots living abroad. Many countries - the friends of Sri Lanka showed their appreciation of this great victory over terrorism and congratulated our President and the people of Sri Lanka. On the 18 th of May a lot of Sri Lankans exchanged their rejoice on line. Some gave phone calls from far away lands.*

*This is one of the many e-mails **Lanka Viththi** received from our patriots and well wishers. They knew how enthusiastic we were about winning this war. One such message did not bear the name of the writer. But his message was very heart warming and truthful. So we thought of printing it here thus his optimistic words were not wasted. Here it is below:*

On the 19th of May 2009, His Excellency the President addressed the nation, declaring that the forces of terror had finally been defeated after almost 26 long years of war and 37 years after Prabhakaran first took up arms. We as a nation did not come to this unforgettable milestone without our fair share of sacrifices and pain, and we were not without external friends and enemies alike.

To all the nations that supported us in our noble war against terrorism, we thank you from the bottom of our hearts. You were the ones who stood by us through the good times and the bad, you were the ones who supported us when the going got tough, and you will not find us ungrateful. This victory is yours as much as ours!

We shall also remember those who tried their level best to save the enemy. Various NGO's, INGO's, foreign diplomats, ministers, secretaries of state, media corporations, human rights cry-babies, world forums and even certain elements in our own country who shamelessly call themselves Sri Lankans tried their utmost to prevent the LTTE from being hurled into the dustbin of history.

Where were they when innocents were being blown up by the terror that gripped Sri Lanka all these decades? Even now, hardly any of these creatures have offered their congratulations to Sri Lanka on being the first nation in history to militarily defeat a terrorist movement. Even now, certain Sri Lankan opposition figures are outside the country, conniving with a Nordic government that sought to carve out an Eelam in our precious land. Even today, most members of the opposition party were nowhere to be seen during the President's victory speech.

But let us not dwell on these sordid neo-colonists and national traitors. Let them lick their wounds. Today, let us celebrate this earth-shattering moment in Mother Lanka's long, illustrious and sometimes bloody history! Let us commemorate the heroes who made this day possible and those who lay down their lives for us!

Beloved President Mahinda Rajapakse, Defence Secretary Gotabhaya Rajapakse and the Commanders of the Army, Navy, Air Force, Police and Civil Defence Force, thank you for providing the leadership our motherland was crying out for when the enemies of our nation had virtually achieved their blood-stained dream of Eelam. Thank you for having the guts to stand up to those who were grandstanding for the Tigers. Thank you for guiding our armed forces towards this most historic triumph!

Ah, our armed forces! Our heroic men and women in uniform! Most glorious sons and daughters of Mother Lanka: mighty descendants of Sinhabahu, our dear patriotic brothers and sisters from the Tamil, Moor, Malay, Burgher and other bloodlines! What you have achieved is from beyond the realms of mere mortals. The gods themselves stand in awe of your epic feats. You have followed in the footsteps of the giants of Dutugemunu and vanquished the demons on land, sea and air.

The devas descend from the heavens on their chariots of gold and the apsaras shower you with flowers, gently falling unto your battle-hardened shoulders in a divine rainbow. The great warriors and kings of the past look on with pride, as do your heroic comrades who lay down their lives for our great nation and now rest peacefully in Mother Lanka's loving embrace. It is thanks to your sacrifices that the bloddthirsty fiends got not one grain of sand, not one blade of grass, not one droplet of water from our cherished motherland.

You have proven to the whole world that our emerald isle, though but a minuscule jewel, can move mountains. You have selflessly taken good care of us without asking for anything in return, and now we will take good care of you and your families. We are forever in your debt. A nation bows to you! Our descendants will sing of your glories for a thousand years to come! Your legacy will remain unmatched, echoing through the ages! Mother Lanka does not bleed from now on, for she has borne warriors as indomitable as thee!

Ranaviru sebelaaneni, mey uththamaachaaraya obatai!

Let us also remember the innocent victims of the defeated monster: the religious leaders who were gunned down in cold blood, the expectant young mothers who had their unborn babies savagely torn from their womb, the hapless innocents who were bombed in buses and railway stations, the children whose lives were taken away by the lost cause of Eelam, the many national leaders who were never allowed to fulfill their true potential. Never again will we Sri Lankans mourn the loss of our loved ones to this abomination! Never again!

' It is over at last, our beloved Mother Lanka. Rest peacefully now. A new beginning shall dawn upon you, one where all your children will live side by side as the family that we are. Your warrior offspring have banished the scourge. Blessed is the nation that has such valiant guardians. '

You can stop crying now, Mother, you can stop crying.!

**Anon**

මාණික්‍ය සේ
පොලෝ ගැබේ
නිධාන වී
ඇත්තෙ ඒ අභීත
දූ පුතුන්
ජාතියේ නාමයෙන්
සංග්‍රාම භූමියේ
ජීවිතේ පුදා හෙළූ
ලේ කඳයි
රත්නදීප ජන්මභූමි
ලංකාදීප විජය භූමි
ඒ අපේ උදාර වූ
මාතෘ භූමියයි!
මාතෘ භූමියයි!

# සෙබළ නුඹයි —— නුඹ නොමියෙයි කිසිදාක

පසුගිය බදාදා මම රණවිරු වෙකුගේ භූමදානයකට ගියෙමි.

අවුරුදු 23 ක් තරම් ලාබාල වූ ඒ තරුණයා මගේ ළඟ ඥාතියෙකි. නම දිනේෂ් දොඩන් ගොඩය.

වයස අවුරුදු 12 දී මහණ වූ ඔහු පන්සලක වැඩවාසය කළේය. බෞද්ධ භික්ෂුවක ලෙස හොඳින් මහණ දම් පිරුවේය. මහණ වූයේද සිය කැමැත්තෙනි.

ඉකුත් නොවැම්බර් මාසයේදී සිවුරුහළ මේ තරුණයා මව්පියන්ට හොරා හමුදාවට බැඳුණේය. ඔහු සිවුරු හැරගොස් හමුදා පුහුණුව ලබන බව සැලවූ ඔහුගේ මවත් පියාත් හමුදා කඳවුර වෙත ගොස් හමුදාවෙන් ඉවත්ව ආපසු එන්නැයි හඬා වැළපී ඉල්ලා සිටියහ. නමුත් ඔහු කීවේ රට රැකගැන්මට මේ මොහොතේ හමුදාවට බැඳීම වඩා වැදගත් බවයි.

පුතු කෙරෙහි මව්පිය දෙදෙනාගේ බැඳීම කොතරම් බලවත්ද යත් තම පුතා හමුදා පුහුණුවෙන් ඉවත්ව පළා ආවොත් රැකවරණය සළසා දෙන්නැයි පුහුණු කඳවුර අසළ ගෙවල්වල වැසියන්ගෙන් ද ඔව්හු ඉල්ලා සිටියහ. නමුත් පුතා හමුදාවෙන් පළා ආවේ නැත.

ජනවාරි මස විසිරයාමේ පෙළපාලියෙන් පසු ඔහු හමුදා සේවයේ ස්ථිර සෙබළෙකු විය.

පුතා අවුරුද්දට ගෙදර එනතුරු මව්පියෝ බලා සිටියහ. නමුත් ඔහු අළුත් අවුරුද්දට පැමිණියේ නැත.

ඔහු අන්තිම වරට මවුපියන්ට දුරකතනයෙන් කතා කළේ පසුගිය මැයි 5 වෙනිදාය. ඉනික්බිති තොරතුරක් නොවීය. ඔහු දිගටම සිට ඇත්තේ පුදුමාතලන් සටන්බිමේය.

මැයි 10 වෙනිදා වැලිපැන්න පොලීසියෙන් නිවසට පැමිණ පුතාට වෙඩිවැදී ඇතැයි දැනුම් දුන්නේය. පොලිසිය ආපසු යන අතරේ ගෙදර අස්පස්කොට තබන්නැයි පණිවුඩයක් එවූහ.

හමුදාව විසින් නිවසට ගෙනැවිත් දෙනු ලැබුවේ සීල් තබන ලද පෙට්ට්ටියකි. පුතාගේ මුහුණ මිස පෙට්ටියක් දක්නට වුවමනා නැතැයි කෑගැසූ පියා පුරහඳ කළුවර චිත්‍රපටයේ තාත්තා මෙන් කෑගැසුවේය. නමුත් හමුදා නිලධාරීන් ඊට ඉඩදුන්නේ නැත.

අවමංගල උත්සවයට ගම්මු විශාල පිරිසක් සහභාගී වී සිටියහ. හමුදා සෙබළුන් පනහක පමණ පිරිසක් සිය සහෝදර සෙබළාගේ පෙට්ට්ටිය ඔසවාගෙන ගියේ හමුදා පෙළපාලියකිනි. සොහොන්ගත කරන්නට පෙර හමුදා ආචාර වෙඩිමුර පත්තු කළෝය.

මහණදම් පුරාගෙන සිටියේ නම් මේ පුත්‍රයා කිසිදු ගැහැටක් නැතිව දීර්ඝ ආයුෂයක් විඳිනු නිසැකය. නමුත් ස්වකැමැත්තෙන් ම ඔහු සිවුර වෙනුවට රටත් ජාතියත් තෝරාගත්තේය.

ළය පැලෙන ශෝකයෙන් හඬා වැළපෙමින් සොහොනේ බිම හිඳගෙන සිටි මව්පිය දෙදෙන සිය පුත්‍රයාට ලැබෙන මේ රාජ්‍ය ගෞරව දෙස බලා සිටියේ සාඩම්බර හැඟුමෙනි.

අහිමි පුත්‍රයා පිළිබඳ ශෝකය ඔවුන් දරාගත්තේ ඒ ගෞරවනීය සැලකුම් දැක්මෙනි.

මේ දීර්ඝ යුද්ධයේ ජයග්‍රහණය සඳහා මෙලෙස මව්පියෝ තම දරුවන්ද, බිරින්දෑවරු තම සැමියන්ද, දූදරුවෝ තම පියාණන්ද සොයුරු සොයුරියෝ තම සොහොයුරාද මේ මාතෘභූමියේ පොළෝතලයට පූජාකර ඇත්තාහ. සෙබළා යනු සෙබළාය. මරණයෙන් පසු ඔහුට වෙනත් නමක් නැත.

මහ පොළවේ සොහොන් කොතක් ඇතත් නැතත් ඉතිහාසය තුළ ඔහු අමරණීය වේ. අනාගතයේද අමරණීය වේ.

♦ **චන්ද්‍රසිරි දොඩන්ගොඩ**

**දිවයින කතෘ මණ්ඩලය Sri Lanka**

| | |
|---|---|
| අහස කළුව සඳ එළියක් නැති | රැක |
| දැනෙන සිතට නුඹ මෙහි නැති දුක | නේක |
| අහසෙ දිලෙන තරු කැටයක් ලෙස | ඇත |
| සෙබළ නුඹයි නුඹ නොමියෙයි කිසි | දාක |

